**ජාතික මාර්ග ජාලය නායයෑම් ආපදාවලින් ආරක්ෂා කර ගැනීමේ ව්‍යාපෘතිය - 2015**

------------------------------------------------------------------------------------------

ජාතික මාර්ග ජාලය නායයෑම් ආපදාවලින් ආරක්ෂා කර ගැනීමේ ව්‍යාපෘතියේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය (ශ්‍රීලංර) හා ජපන් ජාත්‍යන්තර සහයෝගීතා නියෝජිතායතනය (ජජාසනි) අතර 2013 මාර්තු 14 දින එළඹි අංක එස්එල්-පී 109 දරන ණය ගිවිසුම යටතේ මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලැබේ.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

----------------------------------------------------------------------------------

ව්‍යාපෘතියේ ණය ගිවිසුම අනුව, එවකට වරාය, මහාමාර්ග හා නාවික කටයුතු අමාත්‍යාංශය වර්තමානයේ උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර මාර්ග සංවර්ධන අධිකාරිය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. මධ්‍යම, ඌව හා සබරගමුව පළාත්වල උස්බිම් ප්‍රදේශවල සුදුසු ප්‍රතික්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීම මඟින් මූලික යටිතල පහසුකම් ලෙස ඒ-පන්තියේ ජාතික මාර්ග සඳහා ඉලක්ක කර නායයෑම් අවදානම අවම කිරීම හා එමඟින් ආර්ථික හා සමාජ සංවර්ධනය සඳහා දායක වීම සහ මාර්ග ජාලයේ ආරක්ෂාව වැඩි කිරීම සහ මාර්ග භාවිතා කරන්නන් හා පදිංචිකරුවන් ඇතුළත් ජනතාවගේ ජීවිත ආරක්ෂා කිරීම ව්‍යාපෘතියේ අරමුණයි. ණය ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 16,201 කට සමාන ජපන් යෙන් මිලියන 9,591 ක් වූ අතර ඉන් රු.මිලියන 12,870 කට සමාන ජපන් යෙන් මිලියන 7,619 ක් සැපයීමට ජපන් ජාත්‍යන්තර සහයෝගිතා නියෝජිතායතනය එකඟ වී තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2013 ජූලි 05 දින ආරම්භ කරන ලද අතර 2019 මාර්තු 31 වන විට නිම කිරීමට නියමිතය.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

-----------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.4 විගණකගේ වගකීම

---------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරී වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්,වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල

උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ.

මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරිමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියේ විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති සහ පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වියදම ව්‍යාපෘතිය විසින් පවත්වා ගෙන යන ලද වැඩිදියුණු කළ මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව,

(ඇ) ශ්‍රී ලංකා රජය හා ණය සපයනු ලබන නියෝජිතායතනය විසින් සපයන ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතුවලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ණයවලින් කරන ලද මිලදී ගැනීම් හඳුනා ගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව.

(ඈ) ණය යටතේ ආපසු ගැනීම් ණය ගිවිසුමේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදුකර තිබුණේද යන බව.

(ඉ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය හා උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(ඊ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අනුගමනය කරන ලද වර්ගීකරණයට අනුව වියදම නිවැරදිව හඳුනාගෙන තිබුණේද යන බව.

(උ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව.

(ඌ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව සහ,

(එ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

**2. මූල්‍ය ප්‍රකාශන**

**----------------**

**2.1 මතය**

**--------**

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, මා දරන්නාවූ මතය වනුයේ,

(අ) 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව හා 2015 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ කාර්යයන් සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) ණය ගිවිසුමේ දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණයන් සඳහා වූ ඉල්ලුම් පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (විප්‍ර) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව,

(ඈ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක පියවර ගෙන තිබුණු බව, සහ

(ඉ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූ බවත්ය.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

2015 දෙසැම්බර් 31 දිනට උපදේශකවරුන්ට ගෙවිය යුතු රු.මිලියන 7.83 ක මුදලක් ගිණුම්වලට ගෙන නොතිබුණි.

## 3. මූල්‍ය හා භෞතික කාර්ය සාධනය

## 3.1 අරමුදල් උපයෝජනය

මූල්‍යායනය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදනය හා සමාලෝචිත වර්ෂය තුළ සහ 2015 දෙසැම්බර් 31 දින දක්වා අරමුදල් උපයෝජනය පිළිබඳ වැදගත් සංඛ්‍යා ලේඛන කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | ණය ගිවිසුමේ මූලායනය සඳහා එකඟ වූ මුදල | | සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුවේ කරන ලද වෙන්කිරීම | උපයෝජනය කළ අරමුදල් | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | සමාලෝචිත වර්ෂය තුළ | | 2015 දෙසැම්බර් 31 දිනට | |
| | ජපන් යෙන් මිලයන | රු.මිලියන | රු.මිලියන | ජපන් යෙන් මිලියන | රු.මිලියන | ජපන් යෙන් මිලියන | රු.මිලියන |
| ජජාසනි | 7,619 | 12,870 | 350 | 286.62 | 349.85 | 428.90 | 527.79 |
| ශ්‍රීලංර | 1,972 | 3,331 | 100 | 38.03 | 46.42 | 62.77 | 76.62 |
| එකතුව | 9,591 | 16,201 | 450 | 324.65 | 396.27 | 491.67 | 604.41 |

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මාර්ග සංවර්ධන අධිකාරිය විසින් ජාතික ඉතිරි කිරීමේ බැංකුවෙන් ලබාගෙන තිබූ ණය මුදලකින් ව්‍යාපෘති කාර්යයන් ක්‍රියාත්මක කිරීම සඳහා රු.මිලියන 09 ක වෙන් කිරීමක් කර තිබූ බව නිරීක්ෂණය විය. කෙසේ වුවද, ණය නිරවුල් කිරීම පිළිබඳ තොරතුරු විගණනයට පැහැදිලි කර නොතිබුණි.

(ආ) 2013 ජූලි 03 දිනැති අංක එම් පී එච්/එච් ඩබ්ලිව් වයි/ඒ සී සී/03/03/01 දරන, වරාය හා මහාමාර්ග අමාත්‍යාංශයේ ලේකම්ගේ චක්‍රලේඛයට අනුව, වාර්ෂික අයවැය ඇස්තමේන්තු නිරවද්‍යව පිළියෙල කළ යුතුය. කෙසේ වුවද ශ්‍රී ලංකා රජයේ දායකය සඳහා සමාලෝචිත වර්ෂයේ අයවැය ඇස්තමේන්තුවේ රු.මිලියන 100 ක වෙන් කිරීමක් කර තිබූ නමුත් 2015 දෙසැම්බර් 31 දිනට ඉන් රු.මිලියන 46.42 ක මුදලක් පමණක් වැයකර තිබුණි.

## 3.2 භෞතික ප්‍රගතිය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ඉලක්කගත ජාතික මාර්ග පිළිබඳ නායයෑම් ආපදා අවදානම අවම කිරීමේ විස්තරාත්මක සැලසුම් 2015 සැප්තැම්බර් වන විට අවසන් කර තිබුණද, මාස 05 ක ප්‍රමාදයන් සහිතව විස්තරාත්මක සැලසුම් පිළිබඳ වාර්තාව උපදේශක විසින් 2016 පෙබරවාරි මාසයේදී ඉදිරිපත් කර තිබුණි. ඊට අමතරව, 2016 සැප්තැම්බර් මාසයේදී නිම කිරීම සඳහා සැලසුම් කර තිබූ කොන්ත්‍රාත්කරුවන් තෝරා ගැනීම සඳහා යොදාගත් ලංසු ක්‍රියාවලිය 2016 සැප්තැම්බර් 30 දිනට සියයට 86 ක ප්‍රගතියක් පමණක් දක්වා තිබුණි. ව්‍යාපෘති අධ්‍යක්ෂගේ පැහැදිලි කිරීමට අනුව, ප්‍රතිව්‍යුහගත ලංසු පැකේජයන් සඳහා ජපන් ජාත්‍යන්තර සහයෝගීතා නියෝජිතායතනයේ එකඟතාවය ප්‍රමාදයන් සහිතව ලැබී තිබූ අතර එහි ප්‍රතිඵලයක් ලෙස කාලානුරූපව කොන්ත්‍රාත්කරුවන් තෝරා ගැනීම සඳහා කටයුතු කළ නොහැකි වී තිබුණි.

(ආ) 2015 නොවැම්බර් මාසයේදී නිම කිරීමට සැලසුම් කර තිබූ මහනුවර, බදුල්ල, නුවරඑළිය, මාතර,රත්නපුර හා කෑගල්ල දිස්ත්‍රික්කවල මධ්‍යස්ථාන 30 ක කල්තියා අනතුරු හැඟවීම් පද්ධති ස්ථාපනය කිරීමේ වැඩවලින් 2015 දෙසැම්බර් 31 දිනට සියයට 62 ක වැඩ පමණක් නිම කර තිබුණි. කෙසේ වුවද, අදාළ වැඩ මාස 06 ක ප්‍රමාදයක් සහිතව 2016 මැයි මාසයේදී අවසන් කළ බව ව්‍යාපෘතිය විසින් වාර්තා කර තිබුණි.

**3.3 මූල්‍ය පාලන ගැටළු**

---------------------

1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛයේ විධි විධාන ප්‍රකාරව ව්‍යාපෘතිය විසින් ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණි.

**3.4 මානව සම්පත් කළමනාකරණය**

--------------------------------

ලැබුණු තොරතුරු අනුව, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් ව්‍යාපෘති කළමනාකරණ ඒකකය සඳහා 34 ක සේවක සංඛ්‍යාවක් අනුමත කර තිබූ අතර ඉන් තනතුරු 13 ක් පමණක් 2015 දෙසැම්බර් 31 දිනට පුරවා තිබුණි. ව්‍යාපෘති ඉංජිනේරුවරයෙකු, භූ තාක්ෂණ ඉංජිනේරුවරුන් දෙදෙනෙකු සහ තාක්ෂණික නිලධාරීන් 09 දෙනෙකු ආදී ප්‍රධාන තනතුරු 2015 දෙසැම්බර් 31 දිනට වර්ෂයකට වැඩි කාලයක් පුරප්පාඩු වී පැවතුණු අතර ව්‍යාපෘති කටයුතු සුමටව ක්‍රියාත්මක කිරීම සඳහා එය බලපා තිබුණි. තවද, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් උපදේශක තනතුරක් අනුමත කර නොතිබුණද, එක් පුද්ගලයෙකු උපදේශක ලෙස පත් කර තිබුණි. සමාලෝචිත වර්ෂය තුළ එකතුව රු.630,410 ක වැටුප් හා වාහන දීමනා ලෙස ගෙවා තිබුණද, ව්‍යාපෘතියේ උපදේශක සේවා සඳහා දායකත්වය තහවුරු කර ගැනීමට දිනපතා පැමිණීමේ වාර්තා, වැඩ පැවරුම්, වැඩ නිම කිරීම් වාර්තා ආදී ව්‍යාපෘතියට අදාළ වැඩ පිළිබඳ සාක්ෂි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.